පක්ෂ අයවළුන් සිතන්නේ, දීර්ඝකාලීනව එම ගිවිසුම් හරහා රටට යහපතක්ම වන බවය. මේ කාරණය අරභයා ආර්ථික විද්‍යාඥයන්ටත් විවිධ මත තිබිය හැකිය. ප්‍රශ්නය වන්නේ, මේ කියන දේශද්‍රෝහීත්වය න් සැබවින්ම එසේ වන්නේද යන්නයි. කොහෙත්ම ඒවා එසේ නොවේ. ඇත්තෙන්ම ගතහොත්, දොස්තර පාදෙනිය අතොරක් නැතිව රෝගීන් බිල්ලට ගෙන වැඩ වර්ජන කිරීම් හරහා රටට ද්‍රෝහියෙකු වන්නේ යැයි කෙනෙකුට තර්ක කළ හැකිය.

මේ කරුණු සියල්ල සැලකිල්ලට ගත් විට, යම් කෙනෙකු ද්‍රෝහියෙකු වශයෙන් හංවඩු ගැසීම මොන තරම් අසම්භාව්‍ය සහ අවිනිශ්චිත ක්‍රියාවක් විය හැකිද යන්න පැහැදිළි වෙයි.

**මනෝ චිකිත්සක පර්යාලෝකය**

ඉහත සඳහන් කළ ආකාරයෙන් ද්‍රෝහීන්ව හඳුනා ගැනීම සඳහා කෙනෙකුට මනෝ චිකිත්සක ක්‍රමවේදයක් අවශ්‍ය නැත. අවශ්‍ය කරන්නේ, රටක අවශ්‍යතාවන් ඉදිරියේ යම් පුද්ගලයෙකුගේ චර්යාවක් මගින් ඇති කළ හැකි ප්‍රතිවිපාක පිළිබඳ යම් තක්සේරුවක් පමණි. එහෙත් දොස්තර මහතාට අවශ්‍ය කරන්නේ, එවැනි ද්‍රෝහියෙකුගේ මනෝකාය සහ මනස තුළ ඇති යම් සාධක ඇසුරින් එම තැනැත්තාව කල්තියා හඳුනා ගැනීමේ සූත්‍රයක් මනෝ චිකිත්සක වෛද්‍යවේදය තුළ ඇතැයි අපට ඒත්තු ගැන්වීමටයි. ඒ අනුව, කෙනෙකුගේ මනස තුළට කිඳා බැස, ද්‍රෝහීත්වයක අනාගත ඡායාවක් හඳුනාගත හැකි බව ඔහු විශ්වාස කරයි. එවැනි ක්‍රමයක් අප කාටත් මහඟු එළදායී දෙයක් විය හැකිය. මන්ද යත්, න්‍යායාත්මකව ගත්විට ඔබටත් මටත් විශ්වාස කළ හැකි අය කවුද, එසේ විශ්වාස කළ නොහැක්කේ කවුද යන්න දැන ගත හැකි වන බැවිනි.

**ප්‍රජාපීඩක පාලකයන්ට අගනා ප්‍රවෘත්තියක්**

තුර්කියේ එර්ඩොගන් වැන්නන්ට, කාම්බෝජයේ හන්සෙන් වැන්නන්ට සහ උතුරු කොරියාවේ, සදාදර නායක, කිම් ජොන් වැන්නන්ට මෙය අගනා ප්‍රවෘත්තියක් විය හැකිය. අස්ගිරියේ අනුනායක හිමියන් අපේක්ෂා කරන ගෝඨාභය වැනි තද මිනිහෙකු ශ්‍රී ලංකාවටත් ලැබෙයි නම්, එවැනි තත්වයක් තුළ, නිවැරදි ද්‍රෝහියාව හඳුනාගෙන උගෙන් රටට අහිතක් වීමට කලින් රෑකට ගොස් ඌව සුදු වෑන් රියකින් පැහැරගෙන යාමේ හැකියාව අපට ලැබෙනු ඇත. දශක කිහිපයක් ඈතට ගිය විට, අපේ න් අතුරුදහන් කරනු ලැබූ රිචඩ් ද සොයිසා ගැන තවමත් අපි ශෝක වෙමු. මන්ද යත්, ඔහු දේශද්‍රෝහියෙකු නොවූ බැවිනි. ඔහු කෙළේ, ස්වාධීන චින්තකයෙකු වශයෙන් මානව හිමිකම් පිළිබඳව පෙනී සිටිමින් ශිෂ්ට සම්පන්න පුරවැසියෙකු වීම පමණි. මහජන සුභ සිද්ධිය තකා, ඇමතිවරුන්ගේ දුෂ්චර්යාවන් හෙළිදරව් කළ සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංගත් එසේමයි. රිචඩ් සහ ලසන්ත, ඔබ සහ මා මෙන්, රටට ආදරය කළ සැබෑ පුරවැසියන් දෙන්නෙකි.

**මිනිස් සන්තානයේ අඳුරු අහුමුළුවලට වැදීම දුෂ්කරය**

"දශක ගණනාවක් තිස්සේ කළ කොතෙක් පර්යේෂණ තිබුණත්, අපේ මොළේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අප සතු දැනුම තවමත් අල්ප" බව, කාර්නගී මෙලන් විශ්ව විද්‍යාලයේ ස්නායු ඥානන විෂය පිළිබඳ මහාචාර්ය මාලෙන් බේර්මාන් කියයි. අක්මාව සහ වකුගඩු ආදී අපේ වෙනත් අවයව පිළිබඳ හසල දැනුමක් විද්‍යාඥයන්ට ඇතත්, මොළය සහ සිතේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අප සතු දැනුම තවමත් ඉතා අල්පය.

සාක්ෂි දෙන අවස්ථාවකදී බොරු කියන කෙනෙකු හඳුනා ගැනීමේ විෂයමූල සංඥා පිළිබඳව අප අසා තිබේ. මුසා අනාවරකය නැමැති උපකරණයක් ඒ අනුව නිර්මාණය කොට ඇත. ඒ අනුව, කෙනෙකු බොරුවක් කියන විට හඳුනා ගැනීමේ සහතික ලක්ෂණ කිහිපයක් ප්‍රචලිතයි. ඒවා නම්.

1 කට වසා ගැනීම
2 එකම දෙයක් නැවත නැවතත් කීම සහ පමණට වඩා තොරතුරු ඉදිරිපත් කිරීම
3 පලා යාමේ මගක් සැකසීම
4 වචන සහ ශරීර භාෂාව අතර පෑහීමක් නොවීම
5 හුස්ම ගැනීමේ වේගය වෙනස් වීම
6 ඇස්වල ක්‍රියාකාරීත්වයේ සාමාන්‍ය ස්වභාවය වෙනස් වීම
7 ආක්‍රමණශීලී වීම
8 ඇඹරීම

මෙය පවා විවිධ ප්‍රශ්නවලට භාජනය වී ඇති අතර විවිධ ප්‍රායෝගික අභියෝගයන්ට ලක්ව තිබේ. එසේම මෙහිදී කෙරෙන්නේ ක්‍රියාව කරන අතරේ එය හඳුනා ගැනීම මිස ඊට කලින් එය හඳුනා ගැනීම නොවේ. එසේ නම්, ද්‍රෝහීන්ව කල්තියා හඳුනා ගැනීමේ පාදෙනියගේ ක්‍රමය සාර්ථක විය හැක්කේ කෙසේද ? එය විෂයබද්ධ ක්‍රමවේදයක් විය හැක්කේ කෙසේද? එවැන්නක් තුළින් මතුවිය හැකි විවිධ ප්‍රශ්න රාශියක් කෙනෙකුට ගෙනහැර දැක්විය හැකිය.

**රාජද්‍රෝහීත්වය පිළිබඳ පර්යේෂණ**

ගැටුම, රාජද්‍රෝහීත්වය සහ ත්‍රස්තවාදය මනෝචිකිත්සක අවබෝධයක් සඳහා වන ප්‍රයත්නයක්" නැමැති නිබන්ධනයේදී, හුමී බර්තෝ නගේරා (එම්.ඩී) මෙසේ කියයි.

*"රාජද්‍රෝහීත්වය පිළිබඳ විෂය සම්බන්ධයෙන් මනෝ චිකිත්සක සාහිත්‍යය තුළ යොමු වී ඇති අවධානය ඉතා අල්පය. සමහර විට ඊට එක හේතුවක් විය හැක්කේ, අප සැම කෙනෙකු තුළම, අපව බිය වද්දන සහ ලජ්ජාවට පත්කරන, පුංචි ද්‍රෝහියෙකු සිටීම විය හැකිය."*

මිනිසා වූ කලී, අත්‍යන්තයෙන්ම ස්වාර්ථකාමීය. මුදල් හෝ තාන්නමාන්න නිසා ඔහු හොර රහසේම අහිත් පැත්තට පැනිය හැකිය. ඊට ඕනෑ තරම් උදාහරණ ලංකාවේ දේශපාලනයෙන් සොයා ගත හැකිය. මගේ ප්‍රශ්නය වන්නේ, දොස්තර පාදෙනියගේ ලකුණු ක්‍රමය මේ කියන මිනිස් සහජාසයන් සමග ඒකාබද්ධ නොවන්නේද යන්නයි. එසේ වන්නේ නම්, එවැනි ක්‍රමයක ඇති එලය කිම?

දෙවැනුව, යමෙකු ද්‍රෝහියෙකු වීමේ අනාගත ශක්‍යතාවයෙන් යුක්ත යැයි කී පමණින් එම තැනැත්තා ඇත්තෙන්ම එවැනි ක්‍රියාවක නියලේදැයි නිශ්චිතව කිව හැක්කේ කෙසේද? එවැනි ශක්‍යතාවක් ඇත්තෙකු වුවත් සැබවින්ම එම ක්‍රියාව නොකර සිටීමේ හැකියාවෙන් යුක්ත නම්, මෙවැනි සූත්‍රයකින් ඇති ප්‍රයෝජනය කුමක්ද ? එසේම, කෙනෙකු ද්‍රෝහී ක්‍රියාවක් කිරීමට කොතෙක් දුරට සූදානම් දැයි අප දැනගන්නේ කෙසේද?

**නිගමනය**

ද්‍රෝහීත්වයේ මනෝ විද්‍යාව පිළිබඳ මගේ කියවීම තුළ හමු වූ ක්‍රමවේදී දුෂ්කරතා තව බොහොමයකි. දොස්තර පාදෙනියගේ සූත්‍රය මොන වගේ දෙයක්දැයි, ඒ නිසා සාමාන්‍ය පාඨකයාට වටහෙනු ඇත. අප සිටින්නේ ඉතා සංකීර්ණ ක්ෂේත්‍රයකය. එම තත්වය සරළව ගැනීමට බැලීම ලාමක ක්‍රියාවකි.

**සිංහලට පරිවර්තනය කෙළේ " යහපාලනය ලංකා" අනුග්‍රහයෙනි.**




# කෙටි කතාව

**ඩේසි ද සිල්වා**

## සුදුකැටයම් මාළිගා

තත්පර විනාඩි පැය එක් වෙමින් දින සති මාස සමූහයක් ලෙසින් එක්ව වසරින් වසර ඈත අතීතයට සළුපිළි පොරවා තැබුවද, සිහින් සිනිඳු සුළඟකින් පවා සුළු ජීවිත මංතලාවම යළි යළි නිරුවත් කරනු ලබන්නේ කාලය විසින්මයි. කාලනියාමය පරිදි අකාලයේ වැසිමුළු ගතම තෙමාගෙන ද්‍රෝර ගලා ගියේ නෙතේ කඳුළුත් සමගයි. එද ඒ කඳුළු ඒ වැසි බිඳු වෙන්කර හඳුනාගත් කිසිවෙකු අවට නොසිටියේය.

එක්වූහ. කහපැහැ ගනිමින් ගස්වැල් අතු ඉති අතහැරි බිමවැටිච්චි දිරාගිය කොළපත්‍ර මත හිම කුමරිය වැතිර හිටි ආකාරය චමත්කාරය.

එහෙත් මල් කොළ පත්‍ර නැතිව හිස්වූ ගස් විහඟ සමනල් නැවත පහස ලබන්නේ හේමන්තයේදී. එයයි මේ ලෝ දහම හිම් සීතල හමාවන මාවෙත දයාවෙන

හැබැම ලොව හමුවන්නට පෙර
දුටු සිහින ලොවේ අන්තරා
භවය නිමා වූ බැව් දැනි
යන විට එහ අවසා
නය අත ළඟය.
පිළිතුරක් සොයා
යාම උගහටය.

මා තුළ රැඳීගෙන
නොමල මල් යළි යළි
පිපෙනු මැන

හෙමිහිට මා
මිමුණු පදවැල්
ඇසීමෙන්දෝ,
සීත ඇඳුම්
කට්ටල්වලින්
සැරණි ගත්
දියණියන්
දෙදෙනාද
අපවෙත
සේන්දු වූහ.
තාලයකට
නටමින් සැදු
අයිස් බෝල
වලින් එකිනෙකට



ඉස්සරහ දෙර
ළඟට වෙනකම්
අයිස් වැටිලා
නේද? හැරී
නින්දෙන් අවදි
වුවෙකු සේ ඇසු
පැනයට හ්ම්
මේ අයිස් ගොඩ
සුද්ද කරලා
මිසක කාර් එක
එළියට ගන්න
නම් බැරි
වේවි මා එසේ
කියද්දීම හැරී
ඔව් ඉතින්
මේවා ගල්
වෙන්න
ඉස්සර අස්
කලත්, රෑ
එළිවෙනකල්
වැටුනොත් ?
පිළිතුර
ඔහුටම
භාරකර නිහඬ වූ බැව් මට මතකයි. කේන්තිය අයිස් සමග දියවීමට ඉඩහැර මම ගෙතුළට ගොස් බූට් සපත්තු දෙක පැළඳ ආවේ ඔහුට අත්උදව්වක් දීමටයි. සීත සපත්තුවේ අයිස් වැටීම නම් සුලබ දෙයකි. ඉතාලි ජාතිකයින්ට නත්තල් මාසයේ අයිස් වැටීම ප්‍රියමනාපවූ දසුනකි. අයිස් වැටී දියවී මෙන් පසු පොළොවේ විෂබීජ නැසී වියැකී සෞභාග්‍ය උදවන බැව් මාගේ යෙහෙළියක වූ අන්නමරියා මා දැනුවත් කල වාර අනන්තය, උණුසුම් රටකින් මෙවන් රටකට පැමිණි අප වැන්නන්ට මෙම සුභවාදී බවට හිසනැමීමට සිදුවුයේ නිරායාසයෙනි.

දවල්වෙද්දී හිරුඑළිය වැටුනොත් හොඳයි. මා මටම කියා ගත්තද රාත්‍රී පින්නෙන් සුදුහිම කැටිවීම වැළැක්විය නොහැක. ගෙයි පිටුපස මිදිවැල්යායට එබී බැලූ මට සිත තුළ පරාවර්තනය වූ කණගාටුවට සතුටක්ද

පහරදුන් අයුරු. මා දුටු ලස්සනම දර්ශනය නම් එකිනෙකට විසිකල අයිස් ගුලි අතර මගේ විසිරී ඔච්චම් හිනාවකින් ඔවුන්ට සංග්‍රහ කිරීමයි. අයිස් කදු ගසමින් මැදින් වලක් සාදා ඒ මැද දියඇති දැයි පරීක්ෂණ පැවැත්වීම ඒ අසලින් අයිස් එකතු කර ගෙවල් සෑදීම, කඩාවැටීමට ඉඩනොදී කෝටු කෑලි ආධාරකයන් ලෙස යොදා ගැනීම, අක්කා නගෝ සමඟියෙන් ළමාවිය ගත කළ අයුරු රෝද සපත්තු පැළඳ හිමකැට මත පැද්දේ අත්වැල් අල්ලාගෙන. මේ සමනළියන් ගතකළ ළමාවිය කෙතරම් සුන්දරද ? කෙළි පොඩිත්තන් දෙදෙනා අයිස් නාගෙන, නාසයෙන් සොටුදියර ගැලුවද ඔවුනට තරවටු කිරීමට තරම් සාධකයක් මම

28 වන පිටට